| මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය | | |
|---|---|---|
| දෙවන වාර පරීක්ෂණය - 2018 | | |
| පුරවැසි අධ්‍යාපනය | 11 ශ්‍රේණිය | කාලය පැය එකකි |

**නම: ..............................................................**

## I කොටස

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 දක්වා ඇති ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරාන්න.
- ඔබට සපයා ඇති පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

1) ලෝකයේ ද්වි පක්ෂ ක්‍රමයක් ක්‍රියාත්මක වන රට මින් කුමක්ද?

   i. ඉන්දියාව    ii. උතුරු කොරියාව
   iii. මහා බ්‍රිතාන්‍යය    iv.චීනය

2) ඒකීය රාජ්‍යයක දැකිය හැකි ලක්ෂණයක් **නොවන්නේ** කුමක්ද?

   i. පාර්ලිමේන්තු පනතක් මඟින් පරිපාලන බලතල ප්‍රාදේශීය ඒකකවලට පැවරීම.
   ii. පරිපාලන බලතල පමණක් ප්‍රාදේශීය ඒකකවලට පැවරීම.
   iii. ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ බලතල මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාදේශීය ඒකක අතර බෙදියාම.
   iv. ප්‍රාදේශීය ඒකකවලට පවරා ඇති බලතල ඕනෑම අවශ්‍යතාවක නැවත මධ්‍යම ආණ්ඩුවට පවරා ගැනීමට හැකි වීම.

3) ලෝකයේ සංධීය ආණ්ඩු ක්‍රමයක් පවතින රටකට උදාහරණයක් ලෙස දැක්විය හැකි රටක් වන්නේ,

   i. ප්‍රංශය    ii. සුවිස්ටර්ලන්තය
   iii. කියුබාව    iv. මහා බ්‍රිතාන්‍ය

4) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පළාත් සභාවල පලාත් ආණ්ඩුකාරවරයා හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය **නොවන්නේ,**

   i. පළාත් සභා ඡන්දයෙන් තේරි පත්වෙයි.
   ii. පළාත් සභාවේ විධායකය ලෙස කටයුතු කරයි.
   iii. නිල කාලය ඉකුත් වීමට පෙර සිය ධූරයෙන් ඉල්ලා අස් විය නොහැක.
   iv. මධ්‍යම ආණ්ඩුව හා පළාත් සභාව අතර සම්බන්ධීකරණය සිදුකරයි.

5) ඇමරිකාවේ එක්සත් ජනපදයේ මධ්‍යම ආණ්ඩුව හා ප්‍රන්ත ආණ්ඩු අතර බලතල බෙදා දැක්වීමේ දී ප්‍රාන්ත රාජ්‍යන්ට හිමි බලතලයක් වන්නේ,

i. මූල්‍ය කටයුතු　　iv. අධ්‍යාපනය

iii. බදු පැනවීම හා එකරැස් කිරීම.　　iv. විදේශ වෙළෙඳාම හා විදේශ කටයුතු

6) මිනිස් වුවමනාවන් ඉටු කර ගැනීමට ඇති භාණ්ඩ අතරින් ආර්ථික භාණ්ඩයක් හා ආර්ථික නොවන භාණ්ඩයක් පිළිවෙලින් දක්වා ඇති නිවැරදි පිලිතුර තෝරන්න.

i. ආහාර හා වාතය　　ii. ජලය හා ඖෂධ

iii. ඇඳුම් හා වාහන　　iv. හිරු එලිය හා ජලය

7) නිශ්පාදනය කරන භාණ්ඩ ප්‍රයෝජනයට ගන්නා ආකාරය අනුව අන්තර් භාණ්ඩයකට උදාහරණයකි.

i. ගොඩනැගිලි　　ii.සහල්　　iii. යන්ත්‍ර සූත්‍ර　　iv. පොහොර

8) ධනවාදී වෙළෙඳපොල ලක්‍ෂණ වැඩි වශයෙන් දක්නට ලැබෙන රටක් වන්නේ,

i. උතුරු කොරියාව.　　ii. රුසියාව.

iii. කියුබාව　　iv. ඕස්ට්‍රේලියාව.

9) ගෝලියකරණය නිසා ලෝක ආර්ථිකය තුළ දක්නට නොලැබෙන ලක්‍ෂණයක් වන්නේ,

i. බහු ජාතික සමාගම්　　ii. වෙළෙඳාමට යම් බාධාවන් ඇති කිරීමේ ප්‍රවණතාව

iii. විවිධ කලාපිය සංවිධාන බිහිවීම.　　iv. මූල්‍ය අගයන් ස්ථාවරව පැවතීම.

10) රටක විවිධ ජාතීන් ජීවත් වූව ද ඔවුන් එක් ජාතියක් ලෙස සැලකීමයන අදහස පෙර දැරිව බිහි වූ දේශපාලන සංකල්පය වන්නේ,

i. මානවවාදය.　　ii. ලිබරල්වාදය

iii. ගෝලීයකරණය　　iv. ජාතික රාජ්‍ය

11) ශ්‍රී ලංකාව මැතිවරණ කොට්ඨාසවලට බෙදා වෙන් කිරීමේදී සැලකිල්ලට ගනු ලබන ප්‍රධාන නිර්ණායක ලෙස භාවිතා කරන්නේ,

i. භූමිය, ඡන්ද සංඛ්‍යාව　　ii. භූමිය, ජනගහණය

iii. ජන සංඛ්‍යාව, ජන අනුපාතය　　iv. ජන සංඛ්‍යාව, ඡන්ද සංඛ්‍යාව

12) මිශ්‍ර අර්ථ ක්‍රමයක මූලික ලක්‍ෂණයක් වන්නේ,

i. මධ්‍යම සැලසුම් මණ්ඩලයක් මඟින් ආර්ථිකය සැලසුම් කිරීම.

ii. ලාභ ලබා ගැනීමේ අරමුණ ප්‍රධාන ඉලක්කය වීම.

iii. දේපල හා සම්පත් අයිතිය පෞද්ගලික අංශය හා රාජ්‍ය අංශය සතු වීම.

iv. තරඟකාරී වෙළෙඳපලක් පැවරීම.

13) ශ්‍රී ලංකාවේ නව සංවර්ධන ප්‍රවණතා අධ්‍යයනයේදී විවෘත ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ පාඩු ලබන රාජ්‍ය ආයතන පුද්ගලීකරණය කිරීම වැඩි වශයෙන් සිදු වූයේ කුමන කාල අවධියේදී ද?

i. 1948-1960 අවධිය　　ii. 1961-1970 අවධිය

iii. 1970-1977 අවධිය　　iv. 1978-1993 අවධිය

14) ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන වෙළෙඳපොල අර්ථක්‍රමයක ලක්‍ෂණයක් **නොවන්නේ,**

i. රාජ්‍ය ව්‍යවසායක කටයුතු වලින් ඈත් වීම.
ii. රාජ්‍ය විනිමය පාලනයට මැදිහත් වීම
iii. පෞද්ගලික අංශය දිරි ගැන්වීම.
iv. පොදු දේපොල හිමිකාරීත්වය.

15) භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, ව්‍යවසායකත්වය යන නිෂ්පාදන සාධක සඳහා කරන ගෙවීම් පිළිවෙළින් දක්වා ඇති පිළිතුර තෝරන්න.

i. බදුකුලිය, වැටුප්, පොලිය, ලාභය
ii. වැටුප්, බදු කුලිය, පොලිය, ලාභය
iii. බදු කුලිය, වැටුප්, ලාභය, පොලිය
iv. ලාභය, වැටුප්, බදුකුලිය, පොලිය

16) එක්සත් ජාතීන්ගේ සංවිධානය 2000 වර්ෂයේදී පැවැත්වූ සහස්‍රක සමුලුවේදී සහස්‍රක සංවර්ධන ඉලක්කයක් ලෙස සම්මත කරන ලද්දේ මින් කුමක්ද?

i. දුප්පත්කම හා සාගින්න තුරන් කිරීම.
ii. මූලික අවශ්‍යතා තෘප්තිමත් කිරීම.
iii. සමාජ සුරක්ෂිත තාවය ඇති කිරීම.
iv. අන්‍ය සංස්කෘතියන්ට ගරු කිරීම.

17) ගැටුම් ඇති වීමට බලපාන දේශපාලන මූලයට අයත් වන උදාහරණයක් ලෙස දැක්විය හැක්කේ,

i. අයර්ලන්ත යුද්ධය
ii. කුරුස යුද්ධය.
iii. දකුණු අප්‍රිකා වර්ණ භේද ගැටුම.
iv. ඊශ්‍රායල, පලස්තීන ගැටුම.

18) ගැටුම් නිරාකරණය කිරීමේ ක්‍රමයක් ලෙස විනිසීමේ ක්‍රමයේ දක්නට ලැබෙන ලක්‍ෂණයක් වන්නේ,

i. අභියාචනා කිරීමේ හැකියාව
ii. සාකච්ඡා මේසයේදී මුණ ගැසී සාකච්ඡා කිරීම.
iii. අන්‍යොන්‍ය එකඟතාව මත සිදුවීම.
iv. සේවක-සේව්‍ය දෙපාර්ශවයකින් යුක්ත වීම.

19) පළාත් සභා ඡන්ද විමසීමේදී ඡන්ද කොට්ඨාසයක් ලෙස සලකනු ලබන්නේ කවර පරිපාලන ඒකකය ද?

i. පළාත
ii. දිස්ත්‍රික්කය
iii. ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය.
iv. ප්‍රාදේශීය සභා බල ප්‍රාදේශය

20) රජ්‍යයක මූලක ලක්‍ෂණ පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

i. භූමිය, ජනගහණය, අධිකරණය, ස්වාධිපති බලය.
ii. ස්වාධිපති බලය, අගමැති, අමාත්‍යවරු, ජනගහණය.
iii. අධිකරණය, ආණ්ඩුව, ජනගහණය, ජනාධිපති.
iv. භූමිය, ජනගහණය, ආණ්ඩුව, ස්වාධිපතිබලය.

21) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තුන්වන ව්‍යවස්ථාවේ ජනතා පරමාධිපත්‍යයට අයත් **නොවන්නේ** මින් කුමක්ද?

i. විධායක බලතල
ii. පාලන බලතල
iii. මූලික අයිතිවාසිකම්
iv. ඡන්ද බලය

22) එංගලන්තය, ප්‍රංශය, ඕලන්දය, පෘතුගාලය, වැනි රටවල් ප්‍රබල ජාතික රාජ්‍ය වීමට බලපෑමක් නොවූ සිද්ධියක් වන්නේ,

i. යුධ හා නාවික ශක්තිය. ii. ජාතික ඒකාග්‍රතාවය.

iii. දියුණු ආර්ථික තත්ත්වය iv. දීර්ඝකාලයක් යටත් විජිත වීම.

23) පහත දැක්වෙන යුතුකම් අතරින් නීතිමය යුතුකමක් වන්නේ මින් කුමක්ද?

i. රජයට නියමිත බදු ගෙවීම. ii. සමාජ සිරිත් විරිත් පිළිපැදීම.

iii. වැඩිහිටියන්ට ගරු කිරීම. iv. සංස්කෘතීන්ට ගරු කිරීම.

24) නීතියේ මූලික අරමුණක් වන්නේ,

i. රටේ සියලුම පුරවැසියන්ට සාමය ලබාදීම.

ii. රටේ සියලුම පුරවැසියන්ට යුක්තිය ඉටු කිරීම.

iii. රටේ සියලුම වැරදිකරුවන්ට දඬුවම් ලබා දීම.

iv. රටේ අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම.

25) අධිකරණයේ බලතල හා කාර්යයන් වන්නේ,

i. නීති සම්මත කිරීම. ii. නීති සම්පාදනය හා අවශ්‍ය උපදෙස් ලබාදීම.

iii. නීති සම්පාදනය කිරීම. iv. ප්‍රශ්න ඇසීම.

26) ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය සතු අධිකරණ බලතලයක් වන්නේ,

i. වාණිජ ආරවුල් විසඳීම.
ii. පාර්ලිමේන්තු මැතිවරණ පෙත්සම් විභාග කිරීම.
iii. ජනාධිපති පෙත්සම් විභාග කිරීමේ බලය.
iv. බරපතල අපරාධ පිළිබඳ අධිකරණ බලය.

27) ශ්‍රී ලංකාවේ අවසාන හා ඉහළම අභියාචනා අධිකරණ බලය සහිත උපරිමාධිකරණය ලෙස හඳුන්වන්නේ,

i. අභියාචනාධිකරණයයි. ii. මහාධිකරණයයි.
iii. ශ්‍රේෂ්ඨාධිකරණයයි. iv. පළාත්බද මහාධිකරණයයි.

28) පළාත් බද මහාධිකරණය සඳහා විනිශ්චයකාරවරුන් පත් කිරීම සිදුකරනුයේ,

i. පළාත් ආණ්ඩුකාර වරයා විසිනි. ii. අග්‍රවිනිශ්චයකාරවරයා විසිනි.
iii. අගමැති වරයා විසිනි. iv. ජනාධිපතිවරයා විසිනි.

29) ශ්‍රී ලංකාවේ දිසා අධිකරණයකින් විසඳිය හැකි නඩුවර්ගයක් හෝ වැරැද්දක් වනුයේ මින් කුමක්ද?

i. ආදායම් පිළිබඳ නඩු. ii. මැතිවරණ සම්බන්ධ වැරදි.

ii. විශාල මංකොල්ල සම්බන්ධ නඩු iv. ශ්‍රී ලාංකිකයෙකු පිටරටකදී කරන ලද වරදක්.

30) පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් වරයා (ඔම්බුඩ්ස්මන්) හා සම්බන්ධව අදාල නොවන්නේ මින් කුමක්ද?

i. ජනාධිපතිවරයා විසින් පත් කරයි.

ii. වැටුප ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලබයි.

iii. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඇති කරන ලද තනතුරකි.

iv. යහපැවැත්මක් තිබෙනතාක් කල් ධූරය දැරිය හැකිය.

31) රාජ්‍ය මන්ත්‍රණ සභාව හඳුන්වා දෙනු ලැබුයේ මින් කුමන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින්ද?

i. 1910 කෲව් මැකලම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව.

ii. 1921 මැනිං ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව.

iii. 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව.

iv. 1947 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව.

32) ව්‍යවස්ථාදායක සභාවේ ප්‍රථම වරට නිලලත් සාමාජික ප්‍රමාණය ඉක්මවා නිලනොලත් සාමාජික සංඛ්‍යාව වැඩි වූයේ කිනම් ව්‍යවස්ථාව මඟින් ද?

i. 1833 කෝල්බෲක් ව්‍යවස්ථාව මඟින්.

ii. 1910 කෲව් මැකලම් ව්‍යවස්ථාව මඟින්.

iii. 1921 මැනිං ව්‍යවස්ථාන මඟින්.

iv. 1924 මැනිං ඩෙවොන්ෂයර් ව්‍යවස්ථාව මඟින්.

33) ශ්‍රී ලංකාවේ පලාත් සභා පිහිටුවීම සඳහා ක්‍රියාත්මක වූ ආඥාපනත වන්නේ,

i. 1939 අංක 61 දරණ ආඥා පනත.

ii. 1947 අංක 16 දරණ ආඥා පනත.

iii. 1987 අංක 14 දරණ ආඥා පනත.

iv. 1987 අංක 42 දරණ ආඥා පනත.

34) 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයක් වන්නේ,

i. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණයක් පිහිටුවීම.

ii. සමානුපාතික නියෝජන ක්‍රමය හඳුන්වා දීම.

iii. විධායක ජනාධිපති ධූරය හඳුන්වාදීම.

iv. මන්ත්‍රීවරුන් 225 දෙනෙකුගෙන් යුත් පාර්ලිමේන්තුව.

35) 1948 පෙබරවාරි 10 දින මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශය සම්මත කිරීම සිදු වූයේ එක්සත් ජාතීන්ගේ කිනම් ආයතනය මඟින්ද?

i. භාරකාරමණ්ඩලය
ii. ආර්ථික හා සමාජ මණ්ඩලය
iii. ජාත්‍යන්තර අධිකරණය
iv. මහා මණ්ඩලය

36) ශ්‍රී ලංකාවේ වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් සඳහන් කර ඇති පරිච්ඡේදය වන්නේ,

i. III පරිච්ඡේදයේ
ii. II පරිච්ඡේදයේ
iii. I පරිච්ඡේදයේ
iv. IV පරිච්ඡේදයේ

37) පුද්ගලයෙකුට හිමි සිවිල් හා දේශපාලන අයිතිවාසිකම්වලට අයත් වන්නේ මින් තුමන අයිතිවාසිකමක් දැයි තෝරන්න.

i. සාධාරණ නඩු විභාගයකට ඇති අයිතිය.
ii. සමාජ ආරක්ෂණයට ඇති අයිතිය.
iii. අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය.
iv. පෞද්ගලික දේපල දැරීමට ඇති අයිතිය.

38) ''අධ්‍යාපනය ලැබීමට සියලුම ළමයින්ට අයිතියක් ඇත. මූලික අධ්‍යාපනය අනිවාර්ය කිරීමටත් එය නොමිලයේ ලබා දීමට කටයුතු කිරීමත් රජයේ වගකීමකි.'' මෙය සඳහන් වන්නේ එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ කිනම් වගන්තියකද?

i. 1 වගන්තිය
ii. 7 වගන්තිය.
iii. 28 වගන්තිය
iv. 35 වගන්තිය.

39) මූලික මිනිස් අයිතිවාසිකම් භුක්ති විඳීම පිලිබඳ සීමා ද, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වා ඇත. එය සඳහන් වන්නේ,

i. 12 වන ව්‍යවස්ථාවේය.
ii. 13 වන ව්‍යවස්ථාවේය.
iii. 14 වන ව්‍යවස්ථාවේය.
iv. 15 වන ව්‍යවස්ථාවේය.

40) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වන ව්‍යවස්ථාව යටතේ ලැයිස්තු තුනක් යටතේ බලතල දක්වා ඇති අතර මධ්‍යම ආණ්ඩුව (සංචෘත) බලතල ලැයිස්තුවේ ඇතුළත් කාර්යයකි.

i. පළාත් පාලන කටයුතු.
ii. සමාජ සේවා හා පුනරුත්ථාපන කටයුතු
iii. සුළු වාරි මාර්ග කටයුතු
iv. ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන කටයුතු

| මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය | | |
|---|---|---|
| දෙවන වාර පරීක්ෂණය - 2018 | | |
| පුරවැසි අධ්‍යාපනය | 11 ශ්‍රේණිය | කාලය පැය දෙකකි |

**නම: ..............................................................**

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

1)

i. පාලන ක්‍රමයක් ලෙස සෘජු ප්‍රජාතන්ත්‍රවාදයක් වර්තමානයේදී ක්‍රියාත්මක නොවීමට බලපෑ හේතු දෙකක් සඳහන් කරන්න.

ii. රටක ආර්ථික සංවර්ධනය මන්දගාමී වීමටත් සමාජ සාධාරණත්වය ගොඩනැගීම බිඳ වැටීමටත් බලපා ඇති හේතු දෙකක් නම් කරන්න.

iii. භාණ්ඩයක් නිශ්පාදනය සඳහා යොදාගනු ලබන ශිල්පීය ක්‍රම දෙක හඳුන්වන්න.

iv. බෙංගාල මුහුදු තීරය අවට රටවල් පිහිටුවාගත් ආර්ථික සහයෝගීතා සංගමයට (බිම්ස්ටෙක්) අයත් වන සාමාජික රටවල් දෙකක් නම් කරන්න.

v. ගැටුම් පිළිබඳව අධ්‍යනය කිරීමේ දි යොදාගනු ලබන ජොහාන් ගැල්ටුන් විසින් ඉදිරිපත් කර ඇති ත්‍රිකෝණ අරගල ආකෘතියට අයත් අවශ්‍යතා දෙකක් සඳහන් කරන්න.

vi. දේශිය නීතිය යටතේ දක්නට ලැබෙන ප්‍රබේද දෙකක් දක්වන්න.

vii. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පොදු නීතියට අමතරව ක්‍රියාත්මක වන විශේෂ නීති වර්ග දෙකක් සඳහන් කරන්න.

viii. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව අධිකරණයේ ස්වාධීනත්වය ආරක්‍ෂා කිරීම සඳහා ගෙන ඇති පියවර දෙකක් ලියන්න.

ix. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකුට තම මානව අයිතිවාසිකම් කඩවුවහොත් ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න.

x. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ජනාධිපතිවරයා සතු ව්‍යවස්ථාදායක බලතල දෙකක් නම් කරන්න. (2x10 = ල.20)

2)

i. ජාතික රාජ්‍යක ප්‍රධාන ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ල. 02)

ii. නූතන රාජ්‍යයන්හී දක්නට ලැබෙන පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයේ ලක්ෂණ තුනක් දක්වන්න. (ල. 03)

iii. ආණ්ඩුවක් තම පාලන කටයුතු පවත්වාගෙන යාමේදී ජන සමාජයට ඉටු කළ යුතු වගකීම් තුනක් දක්වා ඉන් එක් වගකීමක වැදගත්කම පැහැදිලි කරන්න. (ල. 3+2= 05)

3)

i. බහු සංස්කෘතික සමාජයක දක්නට ලැබෙන මූලික ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ල. 02)

ii. බහු සංස්කෘතික සමාජයක පුරවැසියෙකු විසින් ප්‍රගුණ කළ යුතු ගුණාංග තුනක් දක්වන්න (ල. 03)

iii. බහු සංස්කෘතික ජන සමාජයක ජනතාව එක්සත්ව ජීවත් වීමෙන් ලබාගත හැකි යහපත් ප්‍රතිඵල තුනක් දක්වා ඉන් එක් ප්‍රතිඵලයක් පැහැදිලි කර පෙන්වන්න. (ල. 3+2= 05)

4)

i. මිනිස් වුවමනාවන් ඉටු කර ගැනීමට නිපදවන ආර්ථික භාණ්ඩයක දක්නට ලැබෙන ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ල. 02)

ii. ආර්ථිකයක සිදුවන නිෂ්පාදන මූලික වශයෙන් යෙදී හැකි අංශ තුන නම් කරන්න.

iii. ගෝලීයකරණය නිසා ලෝකයේ රටවල් සියල්ලම විවිධ බලපෑම් වලට නතුවෙමින් පවතී. ඒ අනුව ගෝලීය කරණයෙන් ශ්‍රී ලංකාවට ඇති කර තිබෙන ධනාත්මක බලපෑම් තුනක් දක්වා ඉන් එකක් ඇසුරින් එහි වැදගත්කම පෙන්වා දෙන්න. (ල. 3+2= 05)

5)

i. නීතියේ ගුණාංග දෙකක් සඳහන් කරන්න. (ල. 02)

ii. ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධිකරණවලට අමතරව විශේෂ කාර්යයන් පදනම් කරගෙන පිහිටුවා ඇති විනිශ්චය අධිකාරී හා ආතන වර්ග තුනක් දක්වන්න. (ල. 03)

iii. අප්‍රමාදව හා අපක්ෂපාතීව යුක්තිය පසදළීම සිදු නොවීම නිසා ඇති විය හැකි අවාසි තුනක් දක්වා ඉන් එකක් විස්තර කරන්න. (ල. 3+2= 05)

6)

i. ප්‍රාදේශීය ඒකක වලට බලය විමධ්‍යගත වීමට බලපෑ හේතු දෙකක් සඳහන් කරන්න.

(ල. 02)

ii. පහත සඳහන් ආඥාපනත් මඟින් ස්ථාපිත කරන ලද ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන තුන නිවැරදිව සඳහන් කරන්න.

1. 1947 අංක 16 දරණ ආඥා පනත.
2. 1939 අංක 61 දරණ ආඥා පනත.
3. 1981 අංක 15 දරණ ආඥා පනත. (ල. 03)

iii. ශ්‍රී ලංකාවේ පලාත් පාලන ආයතනවලට පැවරී ඇති කාර්යයන් ප්‍රධාන තේමා තුන යටතේ පැහැදිලි කරන්න. (ල. 3+2= 05)

7)

i. මානව හිමිකම් දිනා ගැනීම සම්බන්ධයෙන් වැදගත් වන ඓතිහාසික අවස්ථා දෙකක් සඳහන් කරන්න. (ල. 02)

ii. මානව අයිතිවාසිකම් හා මූලික අයිතිවාසිකම් අතර වෙනස පැහැදිලි කරන්න. (ල. 03)

iii.

(a) එක්සත් ජාතීන් විසින් සම්මත කරන ලද කාන්තාවන්ට එරෙහි සියලුම ආකාරයේ වෙනස්කම් තුරන් කිරීම පිළිබඳ සම්මුතියහි (ඩීඩෝ) සඳහන් කාන්තාවන්ට හිමි අයිතීන් තුනක් සඳහන් කරන්න.

(ල. 03)

(b) ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියාමාර්ග දෙකක් දක්වන්න.

(ල. 02)